(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **63.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 මාර්තු 26 සිකුරාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ජගත් කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පලනි දිගම්බරම් මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු ගයාෂාන් නවනන්ද මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු හරීන් ප්‍රනාන්දු මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු ඉම්ටියාස් බාකීර් මාකාර් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
ගරු ජයරත්න හේරත් මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා
ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය පිණිස ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් ම'විසින් පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි:—

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු ජගත් කුමාර මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු ඩයනා ගමගේ මහත්මිය."

**2. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම :** (1) විදේශ අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 18 දිනැති අංක 2206/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි ආයතනය විසින් ප්‍රදානය කරන ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) සහ උඩරට නර්තනය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී (ගෞරව) උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජනවාරි 13 දිනැති අංක 2210/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, වලාකුළු පරිගණකකරණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, සයිබර් ආරක්ෂණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව සහ සංගීතවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජනවාරි 13 දිනැති අංක 2210/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව, ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව, ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව සහ අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජනවාරි 22 දිනැති අංක 2211/69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන ව්‍යාපාර පරිපාලන පශ්චාත් සහ යාන්ත්‍ර විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 08 දිනැති අංක 2214/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වන ලදී.

එම ලේඛන, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) ධීවර අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) පොළොන්නරුව, කුරුප්පු හන්දිය, බෝධිරාජ මාවත, අංක 595/181 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එච්. එස්. සුනිල් ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2020.12.05 දිනැති පෙත්සම ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) පොතුහැර, අහුගොඩ, පාලුවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. එම්. එන්. කරුණාතිලක මහතාගෙන් ලැබුණු 2021.02.08 දිනැති පෙත්සම; සහ

(ii) ගල්ගමුව, පාලුකඩවල, ජාගම යන ලිපිනයෙහි පදිංචි එස්. නසාර් මහතාගෙන් ලැබුණු 2021.02.17 දිනැති පෙත්සම

ගරු අසංක නවරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය:** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යෑම සහ පරිපාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, විශ්වවිද්‍යාල මට්ටමෙන් උසස් අධ්‍යාපනය ලබාදීම පිණිස ද, කඳවලවත්ත හා එහි ඇති චංචල දේපළ විශ්වවිද්‍යාලය වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත ඉවත් කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 අප්‍රේල් 05 සඳුදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. දේශීය ආදායම් (සංශෝධන):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 අප්‍රේල් 05 සඳුදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. එකතු කළ අගය මත බදු (සංශෝධන):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 අප්‍රේල් 05 සඳුදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 10.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2021 අප්‍රේල් 05 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 අප්‍රේල් 05 සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. කල් තැබීම (2019 අප්‍රේල් 21 සිදු වූ බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කර විමර්ශනය කර වාර්තා කිරීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් පත්කළ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව):** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

කල්තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2021 මාර්තු 25)

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

( පූ.භා. 11.35 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

( අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරකසභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි ගරු නිමල් පියතිස්ස මහතා, ගරු අනුප පස්කුවල් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 2.35 ට ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.)

''ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 3.49 ට ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් විවාදය කල් ගියේය. එතැන් සිට විවාදය 2021 අප්‍රේල් 07 බදාදා පවත්වනු ලැබේ.

එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව අප්‍රේල් 05 සඳුදා පූ.භා 10.00 වනතෙක් කල් ගියේය.